# දෙවියෝ ද දන් දී දුගතියෙන් මිදී නිවන් අවබෝධ කරති

## පිණ්ඩපාතිකස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 516 - 517)

තුසිත දෙව්ලොවින් පැමිණි දේවතාවෙක් තිස්ස බුදු රජාණන් වහන්සේට පිණ්ඩපාත දානය පූජා කළා. බුදු ගුණයෙහි සිත පහදවා වැඳ නැවත දෙව් ලොවට ගියා.

එම දානය ඒ දේවතාවාට මහත් ආනිසංසයක් ගෙන දුන්නා. කල්ප අනූ දෙකක් සුගතිගාමී වී සැප විඳ ගෞතම බුද්ධ ශාසනයේ පැවිදි ව සසර ගමන කෙළවර කළා.